කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර අවසාන සෙමෙස්තර පරීක්ෂණය (ආර්ථික විද්‍යාව) 2017 / 18

ECN 2225 - ග්‍රාමීය සංවර්ධනය සහ කෘෂිකාර්මික අලෙවිකරණය

කාලය පැ දෙකකි (02)

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න

සියලු ම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ප්‍රමාණයක් ලැබේ.

---

ප්‍රශ්න අංක 01

i. අතීතයේ දී ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සඳහා යොදා ගත් ප්‍රවේශ (Approaches) 04 ක් නම් කරන්න.

ii. ඉහත සඳහන් කළ ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශ අතරින් එකක් (01) කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වඩා යෝග්‍ය වන්නේ ප්‍රජා මූලික (Community Driven) සංවර්ධනයක් ද නැතහොත් රාජ්‍ය මූලික (Government Driven) සංවර්ධනයක් ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

ප්‍රශ්න අංක 02

i. සාහිත්‍යයේ සඳහන් ප්‍රධාන ආසියානු ග්‍රාමීය සංවර්ධන ආකෘති මොනවා ද?

ii. ඉන් එක් ආකෘතියක් සහ එහි උපකල්පන කෙටියෙන් විස්තර කරන්න.

iii. ශ්‍රී ලංකාව තුල එම ආකෘති අනුරූපණය කළ හැකි යැයි ඔබ සිතන්නේ ද?

ප්‍රශ්න අංක 03

i. ග්‍රාමීය සංවර්ධනය සඳහා පවතින ප්‍රධාන කෘෂිකාර්මික ගාමක බලවේග (Driving Forces) හඳුනා ගන්න.

ii. ඕනෑම කෘෂිකාර්මික ගාමක බලවේග දෙකක් කෙටියෙන් පැහැදිලි කර ඒවා ඕනෑම රටක ග්‍රාමීය සංවර්ධනය සඳහා දායක වී ඇති අකාරය පැහැදිලි කරන්න.

iii. "ගොවිතැන යනු ආහාර වලට වඩා වැඩි දෙයකි." ඔබ එකඟ වන්නේ ද? නො වන්නේ ද? රූප සටහන් භාවිතයෙන් ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

ප්‍රශ්න අංක 04

i. ඔබ ග්‍රාමීය ප්‍රදේශයක් නාගරික ප්‍රදේශයකින් වෙන් කර දක්වන්නේ කෙසේ ද?

ii. ශ්‍රී ලංකාවේ වතු හා ග්‍රාමීය අංශය අතර වෙනස කුමක් ද?

iii. කොළඹ නගරයේ යටිතල පහසුකම් සැලසුම් කිරීම සඳහා කොළඹ නගර සංගණනයේ ජනගහන සංඛ්‍යා ලේඛන භාවිත කළ හැකි ද? උදාහරණ සහිත ව ඔබේ පිළිතුර සනාථ කරන්න.

ප්‍රශ්න අංක 05

i. ග්‍රාමීය සංවර්ධනයේ සාම්ප්‍රදායික හා නූතන මතවාද (ක්‍රමවේද) අතර වෙනස කෙටියෙන් සඳහන් කරන්න..

ii. කෘෂිකාර්මික අලෙවිකරණයේ අකාර්යක්ෂමතාවට දායකවන සාධක මොනවා ද?

iii. කෘෂිකාර්මික වෙළෙඳපොළ අකාර්යක්ෂමතාවන් ජය ගැනීම සඳහා ඔබගේ යෝජනා මොනවා ද?

ප්‍රශ්න අංක 06

i. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ශක්තිමත් කෘෂිකාර්මික අංශයක් පැවතීමේ වැදගත්කම කුමක් ද?

ii. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කෘෂිකාර්මික අංශයේ වර්තමාන තත්ත්වය සැලකිල්ලට ගනිමින් කෘෂිකාර්මික අමාත්‍යාංශය සඳහා ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන පිළිබඳ කෙටි විශ්ලේෂණයක් (SWOT Analysis) සකස් කරන්න.

ප්‍රශ්න අංක 07

i. ග්‍රාමීය සංවර්ධනයේ ආකාර මොනවා ද?

ii. නිදහසින් පසු සාර්ථක රාජ්‍ය ගණනාවක් ම ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පෙළඹුනා යැයි ඔබ සිතන්නේ ඇයි?

iii. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වී ඇති දැයි ඔබ සිතන්නේ ද? උදාහරණ කිහිපයක් සපයන්න.

ප්‍රශ්න අංක 08

පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම තුනක් (03) සඳහා කෙටි සටහන් ලියන්න.

i. වී වගාවේ ඉදිරි හා පසුගාමී සම්බන්ධතා
ii. පූර්ණ තරඟකාරී කෘෂිකාර්මික වෙළෙඳපොළ
iii. ඒකාධිකාරී වෙළෙඳපොළ
iv. ග්‍රාමීය ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර ණය පහසුකම්
v. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සේවා ව්‍යාපෘතිවල කාර්යභාරය